**නිමැවුමේ ස්වභාවය**

ළමා ඉතුරුම් ගිණුමකි.

**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**

- සාමාන්‍ය ඉතුරුම් ගිණුමට වඩා වැඩි පොලියක්.
  (නවතම පොලී අනුපාත පිලිබඳ දැනගැනීම සඳහා, https://www.peoplesbank.lk/interest-rates/ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න)
- දිනපතා ගණනය වන පොලිය මාසිකව ගිණුමට බැර වේ.
- වර්ධනය වන ගිණුමේ ශේෂය මත සිසු උදාන ගිණුම් හිමියන් වෙත හිමිවන අධ්‍යාපනික වටිනාකමකින් යුතු ත්‍යාග හෝ ගිණුමට බැර කරනු ලබන මුදල් ත්‍යාග.
- 5 වසර සිසු දරු දැරියන් සඳහා නොමිලේ පවත්වනු ලබන ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන්.
- 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වන දරු දැරියන් සඳහා විශේෂ ඇගයීම්.
- 5 වසර, අ.පො.ස.සාමාන්‍ය පෙළ සහ අ.පො.ස.උසස් පෙළ විශිෂ්ඨ දක්ෂතා දක්වන දරු දැරියන් ඇගයීම සඳහා ත්‍යාග සහ ගිණුමට බැර කරනු ලබන මුදල් ත්‍යාග.

**ආරම්භක තැන්පතු හා ගාස්තු**

- සිසු උදාන ගිණුමක් අලුතින් විවෘත කිරීමේදී රු.250/- ක මූලික තැන්පතුවක් ගිණුම වෙත බැංකුව විසින් පිරිනමනු ලබන අතර පවත්වාගත යුතු අවම ශේෂය රු.500/- කි.
- ගිණුමට අදාළ බදු, සේවා සහ අනෙකුත් ගාස්තු කලින් කලට වෙනස්වීමට යටත්වේ. ඒ පිළිබඳ දැනගැනීම සඳහා බැංකුවේ නිල වෙබ් අඩවිය පරිශීලනය කරන්න.
  **www.peoplesbank.lk**

**සුදුසුකම්**

- වයස අවුරුදු 6 - 18 අතර ශ්‍රී ලාංකික පුරවැසි දරු දැරියන් සඳහා සිසු උදාන ගිණුම විවෘත කළ හැකිය.

**ගිණුම විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර**

- සිසු උදාන ගිණුමක් විවෘත කිරීම සඳහා බැංකුව නිකුත් කරනු ලබන නිත්‍ය මැන්ඩේට්පත නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් ලියකියවිලි සමඟ ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.
  - දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපත.
  - මව / පියා හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත(NIC).
    ජාතික හැඳුනුම්පත නොමැති අවස්ථාවකදී, වලංගු ගමන් බලපත්‍රයේ පිටපත(ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය) හෝ වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත(ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය) භාවිතා කළ හැක.
  - ලිපිනය තහවුරු කිරීමේ ලියවිලි(මැන්ඩේට්පතෙහි සඳහන් කරනු ලබන ලිපිනය උප්පැන්න සහතිකයේ/ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනයට වෙනස් වන්නේ නම් පමණක් මෙය ඉදිරිපත් කළ යුතුය).

## ප්‍රධාන නියම සහ කොන්දේසි

- ගිණුමට අදාළ සියලු නියමයන් සහ කොන්දේසි පිළිබඳ දැනුවත් වීම සඳහා ගිණුම විවෘත කිරීමේ මැන්ඩේට්පත පරිශීලනය කරන්න.
- සිසු උදාන ගිණුම් හිමියාගේ වයස අවු: 18 සම්පූර්ණ වීමත් සමඟම එය YES ගිණුමක් බවට පරිවර්තනය වේ (එහිදී ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළු නවතම තොරතුරු ගිණුම වෙත ඇතුළත් කිරීම සඳහා ගිණුම් හිමියා විසින් ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය).
- ශිෂ්‍යාධාර , අධ්‍යාපනික හෝ වෛද්‍යමය හේතූන් හැර සිසු උදාන ගිණුම් හිමියාට වයස අවු: 18 සම්පූර්ණ වනතුරු මෙම ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට හෝ ගිණුම වැසීමට අවස්ථාව සළසා නොදේ.

මීට අදාළ නවතම තොරතුරු දැනගැනීමට ඔබට ආසන්න මහජන බැංකු ශාඛාව අමතා හෝ මහජන බැංකු නිල වෙබ් පිටුව වෙත පිවිසෙන්න.https://www.peoplesbank.lk/